# අපට අවුරුදු පහයි.

## පන්හිඳයි පින්සලයි

සිසිර දිසානායක

*මල්ලියේ උඹලා කරන කියන දේවල් ගැන මිනිස්සුන්ගේ ඇස් ඇරෙනකොට උඹලා අපි මැරිලා ඉදිවී*

"අන්න ! අන්න !! වැඩේ කැතයි මහත්තයා .."

පන්හිඳ කෑගසුවා. පින්සල ගෙදර සාලයේ තියෙන බඩු මුට්ටුවල දුවිලි රෙදි කැබැල්කින් පිහ දමයි උන්නේ.

"ඇයි ?"

"කනප්පුවේ ඉස්සරහට පේන්න තියෙන කකුල් දෙක විතරයි පිහ දැම්මේ. පස්සේ කකුල් දෙක පිහින්නේ කවුද ? ඒකට වෙනම කෙනෙක් ඕනද ? ඇයි බාගෙට වැඩ කරන්නේ ? පන්ගෙන් පින්ට ප්‍රශ්න වැලයි.

"ඇයි මට විතරක් කියන්නේ ? ඔය ලියන මේසය උඩ තියෙන පින්තූරෙ පිටිපස්සේ පොඩ්ඩක් බැළුවනං ..... "

පන් ලියන මේසේ උඩ තියලා තියෙන තමුන්ගේ දෙමව්පියන්ගේ පින්තූරේ පිටිපස්ස දුවිලි තියෙනවද කියලා ඇඟිල්ලෙන් බැළුවා.

"හැබෑ නේනනං .... " පන් දුවිල්ලේ ඇඟිල්ලෙන් මොනවා දෝ ලිව්වා . "දුවිලි " දුවිලි ....! "

"කවුරු කවුරුත් ඉස්සරහට පේන දේවල් විතරයි පිහිදන්නේ, පොලිෂ් කරන්නේ. ඉස්සරහට පේන දේවල් රැකගෙන, හයිය දීගෙන උදව් පදව් කරගෙන ඒ දේවල් වලට ඉදිරියේ පෙනී හිටින්න කරදෙන දේවල් අමතකයි"

වේදිකාවේ තිරෙන් ඉස්සරහා ඉන්න අය ගැන විතරයි කතා වෙන්නේ. පින්තූර ගත්තේ. ඒ අය විතරයි හැමතැනම ගිහින් මුණ පෙන්නන්නේ. ඉතින් ඒ අයම තමයි අගය වෙන්නේ ; සම්මාන ලබන අය ගැන අහිතක්, ඉරිසියාවක් තරහක් තුන් හිතකවත් නෑ ඒ වුනාට මෙතන මොකක්දෝ වැරැද්දක් නම් තියෙනවා. කොට අඳින අලියි පෙරහැරේ යන අලියි කියලා දෙජාතියක් ඉන්නවනේ. ඕක ඉතින් ඒ ඒ අය ලබා උපන් හැටි .... "

හැම දෙයක්ම කරුමයට බාර දෙන්නේ නැතිව අළුතින් හිතන්න කාලේ හරි. අපි මේ ඉන්නේ ජරා දේශපාලනයෙන් ඔද්දල් වෙච්ච, පිල් බෙදුන, අනුන්ට කපන, වෛර කරන, පම්පෙරි වලට තැන දෙන, එහෙයියන්ට සලකන සමාජයක නෙවෙයිනේ. අපේ උපන් රටට මොන තරම් හොඳ දේවල් තිබුණත් ඔය දේවල් වලට අපේ කැමැත්තක් නෑනේ. ඉතින් ඇයි අපි ඒ දේවල් මෙහාටත් ගෙනත් වපුරන්නේ , "මෙහෙත් ඒ වගේම මඩගොහොරුවක් හදන්නේ "

"අපේ හොඳ දේවල් වගේම නරක දේවලුත් මේ ඇට මිදුලු, ලේ, ජාන අස්සේ හැංගිලා, අපි යන යන තැන එන වා. හරියට හෙවනැල්ල වාගේ "

"මට බය අපේ දරුවන්ටත් ඕවා යාවි ද කියලා. අනේ උන්ටනම් ඔය ගති දෙන්න එපා...." පන් යැද්ද

"බයවෙන්න එපා, උන් අපට වඩා SMART !" පින් කීවා.
"උන් හරියට දුවිලි පිහිදවි !"

"සන්නස" මාසිකයට මේ වෙනකොට අවුරුදු පහක් පිරෙනවා. ජගත් ජේ. එදිරිසිංහ සොහොයුරාගේ කතෘත්වයෙන් ඇරඹුණ "සන්නස" හයවන අවුරුද්දට පියනගන මොහොතේ ඔහුගේ සාහිත්‍යමය නිර්මාණකරණයේ තවත් එක වැදගත් අවස්ථාවකට කටයුතු සූදනම් වෙනවා. මව්බිමේදී උත්සවාකාරයෙන් එළි දැක්වුණ "ඉස්කෝලේ කාලේ" යොවුන් නව කථා "තාරකා විජිතය" නවකථාව සහ "රාජලි පියාපත" කවි එකතුවත් එක්ක " හුදකලා මිනිසා" ගීත සමුච්ඡය මෙල්බර්න් නුවරුන්ට හඳුන්වලා දෙන "මහෝත්සවය" වෙන්නේ මහා උත්සවයක් වෙන නිසාම නෙවෙයි. සාහිත්‍යකරණයේ මහෝත්තමයකුගේ උත්සවයක් වෙන නිසා. ජගත් " මහෝත්තමයෙකු" වෙන්නේ කොහොමද?

සිංහල පුවත්පත් කලාව මෙල්බර්න් නුවර ස්ථාපිත කිරීමට ගත් පුරෝගාමී මෙහෙවර නිසා "සන්නස" වගේම "පහන" මාසිකයටද මුල පුරමින් මෙරට වෙසෙන ලේඛන පිරිසක් වෙනුවෙන් ඉඩ සැලසුන වේදිකාව තනපු නිසා. ඔවුන්ව මෙහෙයවපු නිසා. ඔවුන්ට අත්වැලක් වුන නිසා ඔවුන්ගේ වරද නිවැරදි කල උපදේශකයෙකු වුණ නිසා. ඔවුන්ගේ ගමන් මඟ ආලෝකණය කළ නිසා. ඔවුන්ගේ පෑනින් නැගෙන හඬ විහිදුවා පාලනය කළ නිසා. පිටු සරසමින් සාහිත්‍යමය වටිනාකම් පාඨක අවශ්‍යතාවයක් හා සමාජයීය අවශ්‍යතාවයන් හඳුනාගෙන වේදිකා පරිපාලනය කළ නිසා.

"ඔය සාහිත්‍ය සේවාව කවද කවුරු අදුනාගනියි ද දන්නෑ. එතකොට වළදපු තැන්වල ගසුත් පැලවෙලා තියෙයි. දිවංගත විශාරද ගුණදස කපුගේ මහත්තයා කියාපු දෙයක් මතක් වෙනවා.

"මල්ලියේ උඹලා කරන කියන දේවල් ගැන

42 පිටට






## Family Picnic Organised by Colombo University Alumni Association



A Family Picnic was organised by the Colombo University Alumni Association of Victoria on Sunday 21st March at Tirhatuan Park, Kriegel Way, Dandenong North. This was the first event of the Association after its incorporation. Their next event will be the Family Dinner and Dance to be held on 21st August 2010.

D&S Driving School
Qualified and Experienced Driving Instructor
0421 217 795
•Driver Refresher
•Log Book Training
•Competative Rates
•Specialising in Reverse Parking
•Overseas License Change-over
South Eastern Suburbs Only

S&D SUPERIOR CLEANING SERVICES
DOMESTIC & COMMERCIAL CLEANING
Specializing in
* Regular Home Cleaning
* Vacating Clean
* Builders Cleaning
* Party Help/Clean Ups
* One Off Clean
* Moving Clean
* Spring Clean
* Pre-Sale Clean
T: 03 9708 6296 M: 0411314417 F: 03 9708 6940
E : sdcleanings@yahoo.com.au